# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල
# පදනම පනත

---

[සහතිකය සටහන් කළේ 1978 ඔක්තෝබර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1978 ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

# 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනත

[සහතිකය සටහන් කළේ 1978 ඔක්තෝබර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 59/78

ටවර් හෝල් රඟහල පදනම යනුවෙන් නම් කරනු ලබන පදනමක් පිහිටුවීම පිණිස ද එහි පරමාර්ථ හා බලතල නිශ්චය කිරීම පිණිස ද ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1978 අංක 1 දරන ටවර් හෝල් රඟහල පදනම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජාතික නාට්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම පිණිසත් ටවර් හෝල් රඟහල ජාතික රඟහලක් ලෙස පුනස්ථාපනය කොට ප්‍රයෝජනයට ගැනීම පිණිසත් පදනමක් පිහිටුවනු ලැබිය යුතු ය. ටවර් හෝල් රඟහල පදනම පිහිටුවීම.

3. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වූ (මේ පනතෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් විසින් මේ පදනම පරිපාලනය කරනු ලැබිය යුතු ය:— භාරකාර මණ්ඩලය සංස්ථාපනය කිරීම සහ එහි රැස්වීම.

(අ) මණ්ඩලයේ සභාපති විය යුතු අග්‍රාමාත්‍යවරයා;

(ආ) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා;

(ඈ) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයා;

(ඉ) අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා;

(ඊ) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(උ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඌ) සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයා;

(එ) කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිවරයා;

(ඒ) කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා; සහ

(ඔ) අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු තැනැත්තන් පස් දෙනෙක්. ඔවුන්ගෙන් දෙදෙනකු කලාව පිළිබඳ පිළිගත් ප්‍රවීණතාවක් හෝ උන්නතියක් ඇති තැනැත්තන් විය යුතු ය. මේ ඡේදය යටතේ පත් කරනු ලැබූ එක් එක් සාමාජිකයා ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු විය යුතු ය.

(2) සභාපති හෝ, සභාපති යම් රැස්වීමකට නොපැමිණි විටක ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලැබූ යම් සාමාජිකයකු හෝ ඒ රැස්වීමෙහි මුලසුන දැරිය යුතු ය.

2—ඒ 36607—9,300 (78/09)

(3) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් හය දෙනකු සිටිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම ද මණ්ඩලය විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව විධිමත් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ සාමාජිකයන් අතර ඇති යම් පුරප්පාඩුවක් නොතකා මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

පදනම සංස්ථාවක් විය යුතු බව.

4. පදනම, 2 වන වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

පදනමේ මුද්‍රාව.

5. පදනමේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන තැනැත්තන්ගේ ආරක්ෂිත භාරයෙහි තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; තව ද

(ඇ) මණ්ඩලයේ අනුමතිය ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙන තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

පදනමේ පරමාර්ථ.

6. පදනමේ අරමුණු හා පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) ජාතික නාට්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) රඟහල පිළිබඳ දැනුම, අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම;

(ඇ) රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහි ලා සහාය වීම;

(ඈ) ගීත නාට්‍ය, නැටුම්, නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුක්තවීම; සහ

(ඉ) පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගත යුතු වන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සුදුසු යයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යෑම සහ ප්‍රයෝජනයට ගැනීම.

පදනමේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

7. (1) පදනමේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඊට තුඩු දෙන්නා වූ හෝ ඊට ආනුෂංගික වූ හෝ සියලු දේ කිරීමට පදනමට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම හා ඒ කර්තව්‍ය ඉටුකිරීම පදනම විසින් කරනු ලැබිය හැකි ය.

(අ) දේශීය වූ හෝ විදේශීය වූ හෝ ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍යවලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) මේ පනතින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, තෙස්තමේන්තු නියදනයක් මගින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් පදනම සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හෝ දැරීම සහ වවර් හෝල් රඟහල හැර වෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බදු දීම, ප්‍රදානය කිරීම, හිමිකර දීම, රික්ථවරණය කිරීම, පවරාදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) පදනමේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආධාර මුදල්, පරිත්‍යාග මුදල් හෝ ශිෂ්‍යත්ව දීම ;

(ඈ) පදනම සතු බලතල , කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම සඳහා ද පදනමෙහි පරමාර්ථ ඉෂ්ටකර ගැනීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟ වීම්වලට කෙළින් ම හෝ ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ පදනමෙහි නිලධරයන් හා සේවකයන් මගින් හෝ අනුයෝජිතයන් මගින් හෝ එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම ;

(ඉ) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව, පදනමෙහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම ද, ස්වකීය සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම හා ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ දීම ද පිළිබඳ රීති සෑදීම ;

(ඊ) රඟහල කළමනාකරණය කිරීම හා නඩත්තු කිරීම ද රඟහල හෝ එහි යම් කොටසක් පාවිච්චි කිරීම හෝ රඟහල හෝ එහි යම් කොටසක් මහජනයා විසින් නැරඹීම සඳහා ගාස්තු අයකිරීම ද සම්බන්ධයෙන් රීති සෑදීම ;

(උ) පදනමේ මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙනු ලැබූ යම් ආයෝජනයන්හි මණ්ඩලයේ අභිමතය පරිදි පදනමට අයත් අරමුදල් ආයෝජනය කිරීම සහ ඒ ආයෝජන මණ්ඩලයේ අභිමතය පරිදි ආපසු ලබා ගැනීම, නැවත ආයෝජනය කිරීම හා වෙනස් කිරීම හා ඒ ආයෝජනවලින් උපචිත ආදායම ලබා ගැනීම ; තව ද

(ඌ) පදනමේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කාරණාවලට අදාළ රීති සෑදීම.

8. වවර් හෝල් රඟහල සහ එයට අනුබද්ධ භූමි භාගය වෙනස් කළ නොහැකි පරිද්දෙන් පදනම සතුවන අතර එම රඟහල හා භූමි භාගය එසේ මෙයින් පදනමට සතුකර දෙනු ලැබේ. වවර් හෝල් රඟහල සතුකර දීම.

ටවර් හෝල් රඟහල පදනමෙහි අරමුදල පිහිටුවීම.

9. (1) මේ පනතෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, "ටවර් හෝල් රඟහල පදනමෙහි අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලය සතු විය යුතු ය.

(3) පදනමේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුව විසින් පදනමට ආධාර මුදල් වරින් වර ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අරමුදලට කළ යුතු ගෙවීම්.

10. පහත සඳහන් මුදල් අරමුදලට ගෙවිය යුතු ය:—

(අ) මුදලින් කෙරෙන තෑගි හෝ පරිත්‍යාග;

(ආ) 9 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබෙන යම් ආධාර මුදලක්;

(ඇ) රඟහල හෝ එහි යම් කොටසක් පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීමෙන් සහ ඇතුළුවීම සඳහා ටිකට් පත් විකිණීමෙන් ලැබෙන යම් ආදායමක්;

(ඈ) රඟහල හෝ එහි යම් කොටසක් මහජනයා විසින් නැරඹීම සඳහා අය කෙරෙන ගාස්තුවලින් ලැබෙන යම් ආදායමක්; සහ

(ඉ) ආයෝජනවලින් හෝ පදනමට අයවිය යුතු වෙනත් ලැබීම් වලින් හෝ ලැබෙන යම් ආදායමක්.

අරමුදලින් කළ යුතු ගෙවීම්.

11. පහත සඳහන් කටයුතු සඳහා අරමුදලින් ගෙවිය යුතු ය:—

(අ) පදනම ක්‍රියාත්මක කිරීම, එහි ආයතන කටයුතු හා නඩත්තුව සඳහා අවශ්‍ය වියදම්;

(ආ) රඟහල අත්කර ගැනීම, අලුත්වැඩියා කිරීම සහ වැඩි දියුණු කිරීම පිණිස කොළඹ මහ නගර සභාවට මෙතෙක් දැරීමට සිදු වූ වියදම්;

(ඇ) රඟහල නඩත්තු කිරීමේ, එයට අමතර කොටස් එකතු කිරීමේ, එය වෙනස් කිරීමේ හෝ එය වැඩි දියුණු කිරීමේ වියදම්;

(ඈ) නිලධරයන්ට, මෙහෙකරුවන්ට හා වෙනත් සේවකයන්ට වැටුප් ගෙවීම; සහ

(ඉ) පදනමේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වේ යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්.

ගිණුම් හා විගණනය.

12. (1) පදනමේ ආදායම හා වියදම ද, වත්කම් හා බැරකම් ද වෙනත් සියලු ගණුදෙනු ද සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි ගණන් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින පවත්නා පරිදි ස්වකීය ගණන් පොත් තුලනය කරවා ගැනීම ද ඒ දිනය තෙක් සකස් කරන ලද පදනමෙහි අය වැය ගිණුමක් සහ එදින තෙක් වූ වත්කම් හා බැරකම් පිළිබඳ සම්පිණ්ඩනයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ඊළඟ මාර්තු මස තිස් එක් වන දිනට පෙර පිළියෙල කරවා ගැනීම ද මණ්ඩලය විසින් කළ යුතු ය.

(3) අය වැය ගිණුම හා ශේෂ පත්‍රය මණ්ඩලයේ සභාපති විසින් ද ඒවා අත්සන් කිරීමට මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ පදනමේ වෙනත් යම් නිලධරයන් විසින් ද අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) සුදුසුකම්ලත් විගණකවරයකු විසින් පදනමෙහි ගණන් විගණනය කරනු ලැබිය යුතු ය.

(5) පදනම විසින්, වර්ෂයක් පාසාම, අවසන්ව ඇති වර්ෂයේ පදනමේ වැඩකටයුතු පිළිබඳ වාර්තාවක් හා මුදල් තත්ත්වය පිළිබඳ වාර්තාවක් පිළියෙල කොට සුදුසුකම් ලත් විගණකවරයාගේ වාර්තාව ද සමඟ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, අදාළ වන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂය ඉකුත් වීමට පෙර, මහජනයාගේ දැන ගැනීම සඳහා එය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

13. (1) යම් භාණ්ඩ ආනයනය කිරීම පදනමෙහි පරමාර්ථ හා අරමුණු නංවාලීම සඳහා හිතකර යයි සලකනු ලැබේ නම් අග්‍රාමාත්‍යවරයා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, පදනම විසින් ආනයනය කරනු ලබන ඒ භාණ්ඩ වෙනුවෙන් යම් තීරු බද්දක් ගෙවිය යුතු වීමෙන් පදනම නිදහස් කළ හැකි ය. ඇතැම් තීරු බදුවලින් හා බදුවලින් පදනම නිදහස් කිරීම.

(2) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් පදනම නිදහස් විය යුතු ය.

(3) මහ නගර සභා ආඥාපනත යටතේ යම් වරිපනම් බද්දක් ගෙවිය යුතු වීමෙන් පදනම නිදහස් විය යුතු ය.

(4) යම් තැනැත්තකු පදනමට තෑග්ගක් පිරිනමන අවස්ථාවක, එම තෑග්ගේ මුළු වටිනාකමේ ප්‍රමාණයට, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බද්ද ගෙවිය යුතු වීමෙන් ඒ තැනැත්තා නිදහස් විය යුතු ය.

(5) යම් තැනැත්තකු පදනමට පරිත්‍යාගයක් කරන අවස්ථාවක 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි කාර්ය සඳහා එම පරිත්‍යාගය අනුමත වියදමක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් ඒ පනත යටතේ සහනය ලැබීමට ඒ ත්‍යාගදායකයා හිමිකම් ලැබිය යුතු ය.

(6) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතෙහි හා මහ නගර සභා ආඥාපනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියෙහි විධිවිධාන බලපැවැත්විය යුතු ය.

රජයේ නිලධරයන් හා පළාත් පාලන සේවයේ සාමාජිකයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

14. (1) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ හා එකී ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයෙහි නියුක්ත යම් නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයෙහි නියුක්ත යම් නිලධරයකු පදනමේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නියමිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු පදනම විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් පදනමට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයෙහි යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ ආයතනයේ කැමැත්ත ඇතිව, එබඳු ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා පදනමෙහි කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ ආයතනය එකඟවන නියම හා කොන්දේසි පිට, අවස්ථාවෝචිත පරිදි ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ හා ඒ ලේකම්වරයාගේ හෝ ඒ ආයතනයේ කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයෙහි වෙන යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් හා පදනමේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

**15.** (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්යයන් සඳහා පත් කරනු ලැබූ පදනමේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) පදනම විසින් හෝ එයට විරුද්ධව හෝ යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනම විසින් දරනු ලැබූ යම් වියදමක් පදනමේ මුදල්වලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පදනමට ගෙවනු ලබන හෝ පදනම විසින් අයකර ගනු ලබන ගාස්තු කිසිවක් පදනමේ මුදල්වලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ කරනු ලැබූ හෝ කරන ලදැ යි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරනු ලැබූ යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යැයි අධිකරණය තීරණය කරනහොත්, ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගෙන ඇතහොත් මිස, පදනමෙහි මුදල්වලින් ගෙවිය යුතු ය.

පදනමේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**16.** පදනමට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ පදනමේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

පදනමේ නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස දණ්ඩ නීති සංග්‍රහය යටතේ සැලකෙන බව.

**17.** පදනමේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

පදනම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**18.** පදනම, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

**19.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නාවූ හෝ සමාන වන්නාවූ

බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ.

"සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.